විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு
Ministry of Science and Technology

මගේ යොමුව / எனது இல. / My Ref.

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2025.11.08

**ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/කර්තෘ**

**ප්‍රවෘත්ති නිවේදනය**

**ජාතික විද්‍යා සතිය 10 දා ඇරඹේ... විද්‍යාව ප්‍රචලිත කිරීමට සතිය පුරා වැඩසටහන් මාලාවක්...**

**"විශ්වාසය ගොඩනංවමින් පරිවර්තනීය යුගයක් කරා: ශ්‍රී ලංකාවේ හෙට දවස උදෙසා විද්‍යාව"** තේමා කරගනිමින් ජාතික විද්‍යා සතිය ලබන 10 දා ඇරඹීමට නියමිතය. මේ පිළිබඳ දැනුවත් කිරීමේ පූර්ව මාධ්‍ය සාකච්ඡාවක් විද්‍යා හා තාක්ෂණ අමාත්‍ය මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතාගේ ප්‍රධානත්වයෙන් අද දින පැවැත්විණි.

**ලෝක විද්‍යා දින සැමරුම - 2025**

යුනෙස්කෝ විධායක මණ්ඩලය 2001 වර්ෂයේ දී, සාමය හා සංවර්ධනය සඳහා වූ ලෝක විද්‍යා දිනය ලෙස නොවැම්බර් 10 දිනය ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව ප්‍රථම ලෝක විද්‍යා දිනය 2002 නොවැම්බර් 10 දින යුනිස්කෝ අනුග්‍රහය යටතේ ලොව පුරා සමරනු ලැබිණි.

**ජාතික විද්‍යා දින සැමරුම සහ ජාතික විද්‍යා සතිය - 2025**

ලෝක විද්‍යා දින සැමරුමෙන් පූර්වාදර්ශය ලබා ගනිමින් ශ්‍රී ලංකාවද 2004 වර්ෂයේ සිට සෑම වර්ෂයකම නොවැම්බර් දහය දිනට යෙදෙන ලෝක විද්‍යා දිනය සැමරීම සිදු කරන ලදී. 2017 වර්ෂයේ දී විශේෂ කැබිනට් තීරණයක් අනුව ජාතික විද්‍යා දිනයේ ඊට සමගාමීව ජාතික විද්‍යා සතියක් සැමරීමද ආරම්භ කෙරිණි. එතැන් සිට මේ දක්වා අඛණ්ඩව විද්‍යා හා තාක්ෂණ විෂය භාර අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් ජාතික විද්‍යා දිනය උත්කර්ෂවත්ව සැමරීම සිදුකරයි.මෙහිදී එක් එක් වර්ෂය සඳහා කාලීන වශයෙන් වැදගත් තේමාවක් යොදා ගැනීම සිදුකරයි.

"විශ්වාසය ගොඩනංවමින් පරිවර්තනීය යුගයක් කරා: ශ්‍රී ලංකාවේ හෙට දවස උදෙසා විද්‍යාව" යන්න තේමා කරගනිමින් මෙවර විද්‍යා දින සැමරීම නොවැම්බර් 10වන දින බත්තරමුල්ල වෝටර්ස් ඒජ් හි දී පැවැත්වේ. නොවැම්බර් 10 - 14 දක්වා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ සහ ඊට අනුබද්ධ ආයතනයන්හි මෙහෙයවීමෙන් ජාතික විද්‍යා සතිය ක්‍රියාත්මක කෙරේ.

**ජාතික විද්‍යා දිනය සහ විද්‍යා සතිය සැමරීමේ අරමුණු**

- තිරසර සංවර්ධන ඉලක්ක ජය ගැනීමට හැකි දැනුවත් සමාජයක් නිර්මාණය කිරීමට විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.
- සමාජ සංවර්ධනය උදෙසා විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ භාවිතාවන් වෙනුවෙන් ජාතික හා ජාත්‍යන්තර සහයෝගීතාවය ප්‍රවර්ධනයය කිරීම.
- දිළිඳු බව තුරන් කිරීමට විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ දායකත්වය ලබාදීම.
- විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ මැදිහත්වීම සහ ජාතික සංවර්ධනය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම යනාදියයි.

**විද්‍යාව ප්‍රචලිත කරමින් විද්‍යා සාක්ෂරතාව ඉහල නැංවීම සහ මෙවර වැඩපිළිවෙළ**

නවීන විද්‍යාවන් පර්යේෂණ සහ නවෝත්පාදන ඇතුළු ලොව නැගී එන තාක්ෂණික ධාරාවන් පිළිබඳ දැනුම හා අවබෝධය ව්‍යාප්ත කර ජනතාවට සමීප කරවීම මෙහිදී ඉතා වැදගත් වේ. ඒ සඳහා සමාජය තුළ විද්‍යාව ප්‍රචලිත කරමින් විද්‍යා සාක්ෂරතාව ඉහල නංවා ගැනීම ඉතා වැදගත් පියවරකි. ජාතික විද්‍යා දිනය සහ විද්‍යා සතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණ වන්නේ එයයි. **(වැඩිදුර තොරතුරු ඇමුණුමේ දක්වා ඇත)**

නිත්‍යා සිල්වා
ගරු අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්

3 වන මහල, "සෙත්සිරිපාය" 1 වන අදියර, බත්තරමුල්ල.
3வது தளம், "செத்சிறிபாய" கட்டம் 1, பத்தரமுல்லை.
3rd floor, "Sethsiripaya" Stage I, Battaramulla.

කාර්යාලය / காரியாலயம் / Office
(+9411) 2879410
(+9411) 2879412
motrdevelopment@gmail.com
www.mostr.gov.lk

විද්‍යාව, තාක්ෂණය නවෝත්පාදනය පදනම් කරගත් සමාජයක් ගොඩනැගීමටත්, පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රතිලාභ මෙරට ආර්ථිකයට සහ ශ්‍රී ලාංකේය ජනතාවට උරුම කර දීම සඳහා පහසුකම් සැලසීමටත් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ සැම විටම උත්සුක වේ. ඒ වෙනුවෙන් වූ පියවරක් වන **ජාතික විද්‍යා සතියේ අපේ ක්‍රියාකාරකම් පහත පරිදි වේ.**

1. ජාතික විද්‍යා සතිය නිල වශයෙන් ආරම්භ කිරීම නොවැම්බර් මස 10 වන දින බත්තරමුල්ල වෝටර්ස් එජ් පරිශ්‍රයේදී සිදුකෙරෙන අතර එහිදී විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදනය සහ රාජතාන්ත්‍රික සබඳතා ශක්තිමත් කරගැනීමේ විද්‍යාත්මක ප්‍රවේශයන් හඳුනාගැනීම පිලිබඳ පුළුල් සංවාදයක් ගොඩනැගීමට අපේක්ෂා කෙරේ.
2. කැළණිය විශ්ව විද්‍යාලය සහ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ සම සංවිධානයෙන් පැවැත්වූ පාසල් සහ විශ්ව විද්‍යාල සිසුන්ගේ නවෝත්පාදන හැකියාවන් ජාතික තලයට ගෙන ඒමේ ජාතික හැකතන් තරගාවලිය වන HackX තරගාවලියේ ජයග්‍රාහකයින් ප්‍රකාශයට පත් කිරීම හා තිළිණ ප්‍රධානය නොවැම්බර් මස 11 වන දින සිදු කෙරෙන අතර රටේ හඳුනාගත් ගැටළු සඳහා නිර්මාණය කරන ලද තාක්ෂණික විසඳුම් එලි දැක්වීම ද මෙහිදී සිදු වේ.
3. විද්‍යා හා තාක්ෂණ අමත්‍යාංශයට අනුබද්ධ පර්යේෂණ සහ සංවර්ධන ආයතනයන්හි සහභාගීත්වයෙන් වසර 08කට පසුව කාර්මික තාක්ෂණ ආයතනය කේන්ද්‍ර කරනිමින් මහජන දිනයක් හා පා ගමනක් නොවැම්බර් 11 දින පැවැත්වේ.
4. ශ්‍රී ලංකාවේ අභ්‍යවකාශ තාක්ෂණයේ මූලපිරීම ඇතුළු නවීන විද්‍යාත්මක දැනුම ප්‍රායෝගිකව ලබා දීමේ අරමුණින් නොවැම්බර් මස 12, 13 දිනයන් හි නවීන තාක්ෂණය පිලිබඳ ආතර් සී ක්ලාර්ක් ආයතනය, ජාතික මූලික අධ්‍යයන ආයතනය, SLIIT සහ CINEC යන ආයතනයන් හි විවිධ වැඩසටහන් රාශියක් දිනය පුරා පැවැත්වේ. මේ සඳහා පාසල් සිසුන්ට ලියාපදිංචි වීමේ අවස්ථා අමාත්‍යාශය සහ එම ආයතන මඟින් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබා දී ඇත.
5. විද්‍යා සතියේ අවසන් දිනය වන නොවැම්බර් මස 14 දින පාසල් දරුවන් සඳහා වෙන්වූ විද්‍යා ලිපි රචනය පිලිබඳ වැඩමුළු, කලාවේ සහ විද්‍යාවේ මුසුවීම පිළිබඳ ප්‍රයෝගිකව අත්දැකීමේ අවස්ථා බත්තරමුල්ල වෝටර්ස් එජ් පරිශ්‍රයේ සිදුකිරීමට කටයුතු සංවිධානය කර ඇත. මෙම වැඩසටහන් විශ්ව විද්‍යාල විද්‍යා සංගම්වල මූලිකත්වයෙන් සංවිධානය කෙරේ.

මීට අමතරව ශ්‍රී ලංකාව තුළ පර්යේෂණ සංස්කෘතියක් සංවර්ධනය වෙනුවෙන් සාධනීය මූලපිරීම් ඇතුළු පර්යේෂණ ආචාරධර්ම, බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම, ව්‍යවසායකත්වය සහ නවෝත්පාදන සංවර්ධනය යන ක්ෂේත්‍රයන්ගේ ප්‍රගමනය සඳහා වූ වැඩසටහන් රාශියක් සංවිධානය කර ඇත. **(ඇමුණුම 2)**

විද්‍යා දිනය පිළිබඳ යාවත්කාලීන තොරතුරු හා වැඩසටහන් පිළිබඳ වැඩිදුර තොරතුරු **National Science Week 2025** ෆේස්බුක් පිටුව ඔස්සේ ලබාගත හැක.

## National Science Week 2025
## $10^{th}$ – $14^{th}$ November

### Building Trust, Driving Transformation: Science for Sri Lanka's Tomorrow

| Date | Time | Description | Venue |
|---|---|---|---|
| 10 | 9.00AM – 12.30 PM | Science for Evidence Base Decision Making Lessons Learned from Sri Lanka – MOST / NASSL | Waters Edge, Battaramulla |
| | 1.30 PM – 6.00PM | Role of Science Diplomacy in Informed Decision-<br>Making at the Science-Policy Interface - MOST /MFA | Waters Edge, Battaramulla |

| | | | |
|---|---|---|---|
| 11 | 8.00 AM - 10.00 AM | Science Walk - ITI | Torrington to ITI |
| | 9.00 Am – 4.00 PM | Open Day - ITI | ITI, Colombo Premises |
| | 9.00 AM – 12.30PM | Translating Science to Practice : Science Popularization through Modern Tools & Technology –CINEC Campus | CINEC Campus, Malabe |
| | 9.00 AM – 1.00 PM | Hands-on Workshop on Renewable Energy Conversion and Storage Devices for School Science Students - NIFS | NIFS |
| | 8.00 AM – 7.00 PM | National Science Hackathon – MOST / UOK/NSF<br>Awarding the winners of Quiz Competition - MOST / Science Societies | Waters Edge, Battaramulla |
| 12 | 9.00AM – 12.00 Noon | Industry and Open Day - ACCIMT | ACCIMT |
| | 9.00 AM – 4.00 PM | Space Technology Exhibition -ACCIMT | ACCIMT |
| | 9.00 AM – 12.30PM | Translating Science to Practice : Science Popularization through Modern Tools & Technology –CINEC Campus | CINEC Campus, Malabe |
| | 9.00 AM – 4.00 PM | Exploring Science through Virtual Reality - SLIIT | SLIIT, Malabe |
| 13 | 9.00 AM – 4.00 PM | Space Technology Exhibition - ACCIMT | ACCIMT |
| | 9.00 AM – 4.00 PM | Exploring Science through Virtual Reality - SLIIT | SLIIT, Malabe |
| | 9.00 AM – 12.30 PM | Ethics, Governance & Research Integrity – MOST / IRD | Waters Edge, Battaramulla |
| | 8.30 AM – 5.00 PM | Open Forum on breaking Barriers: The new Age of Entrepreneurs in STEM – SLAYS | Waters Edge, Battaramulla |
| | 9.30 AM – 12.00 Noon | IP & IP Rights Seminar - SLIC | BMICH |

| | | | |
|---|---|---|---|
| | 9.00 AM – 1.00 PM | “Eat Smart, Live Strong” – A Workshop on the Power of a Balanced Diet – NIFS | NIFS |
| 14 | 9.00 Am – 1.00 PM | Innovate to Impact: Celebrating Science in Action : A showcase of Sri Lankan Innovation Commercialization - NIA | Waters Edge, Battaramulla |
| | 9.00 AM – 12.00 Noon | Science Arena / Science Meets Arts – MOST / Science Societies/SLSI/NSF/NIFS | Waters Edge, Battaramulla |
| | 2.00 PM – 5.00 PM | Closing Ceremony - MOST | Waters Edge, Battaramulla |